# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2135/52 - 2019 අගෝස්තු මස 07 වැනි බදාදා - 2019.08.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය)**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ අංක 06 සාලම්බෙයිකුලම් කොට්ඨාසයට තේරී පත්වූ නාහූර් පිච්චෙයි ජවාහීර් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ අංක 06 සාලම්බෙයිකුලම් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුබ්‍රමනියම් ගනේසන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී ජේසුදාසන් ජෙනිටන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් සුබ්‍රමනියම් ගනේසන්, වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාවේ අංක 06 සාලම්බෙයිකුලම් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ජේ. ජෙනිටන්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
වවුනියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 07 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
වවුනියාව.

08 - 827

1A - G 30702 — 27 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*